# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිලිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 11.රාජ්‍ය හා පෞද්ගලික වාහන රථ ගාල්

මෙම මාර්ගෝපදේශ නාගරික සභා විසින් පවත්වාගෙන යනු ලබන රාජ්‍ය හා පෞද්ගලික රථගාල් ක්‍රියාකරුවන් සහ භාවිතා කරන්නන් සඳහා අදහස් කෙරේ.

**නිශ්චිත පණිවිඩ / උපදෙස්**

**හිමිකරු / ක්‍රියාකරු / වාහන නැවැත්වීමේ ගාස්තු එකතු කරන්නා**

- විවෘත කිරීමට පෙර, මුහුණු ආවරණ , විෂබීජ නාශක වැනි අවශ්‍ය සැපයුම් වෙන් කරවා ගෙන අවශ්‍ය පරිදි අවම කාර්ය මණ්ඩල සංඛ්‍යාවක් ලබා ගැනීමට සැලසුම් කරන්න.
- ගනුදෙනුකරුවන් සමග සෘජුව මැදිහත් වන සියළුම සේවකයින් මුහුණු ආවරණ පැළඳ සිටින බවට සහතික වන්න, සහ අවශ්‍ය පරිදි ඇල්කොහොල් අඩංගු අත් සේදුම්කාරක භාවිතා කරන්න. සංවෘත කුටිවල වාඩි වී ස්වයංක්‍රීය පිවිසුම් දොරටු පාලනය කරන සිටින සේවකයින්ට මුහුණු ආවරණ අත්‍යවශ්‍ය නොවනු ඇත.
- අත් සේදීම සඳහා ස්ථානයක් (දියර සබන් සමඟ) කාර්ය මණ්ඩලයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ලෙස ස්ථාපනය කළ යුතුය (උ.දා. - පිවිසුම් හා පිටවීමේ දොරටුවල)
- සේවකයින්ගේ සෞඛ්‍යය පිළිබඳව දිනපතා විමසීමේ ක්‍රමයක් ඇති කරන්න. (උණ සහ කැස්ස / සෙම්ප්‍රතිශ්‍යාව වැනි ශ්වසන රෝග ලක්ෂණ විමසන්න) සහ ඔවුන්ට සුදුසු වෛද්‍ය උපදෙස් ලබා ගැනීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කරන්න
- නිරන්තරයෙන් ස්පර්ශ වන පෘෂ්ඨයන් නිතිපතා පිරිසිදු කර විෂබීජහරණය කරන්න (කවුන්ටර / ස්වයංක්‍රීය යන්ත්‍ර බොත්තම්).
- පුද්ගලයන් අතර සම්බන්ධතා අවම කිරීම සහ මුදල් මාරු කිරීම සඳහා ස්වයන්ක්‍රීය / වාහන නැවැත්වීමේ ගෙවීම් යන්ත්‍ර භාවිතා කිරීම සහ දිරිමත් කිරීම.
- වාහන නවත්වා කරනු ලබන විමසීම අවම කරගැනීමට නැවැත්වීමේ ගාස්තු හොඳින් ප්‍රදර්ශනය කරන්න.
- මුදල් පරිහරණය අවම කිරීම සඳහා නිශ්චිත මුදලක් ලබා දීමට සේවාදායකයින් දිරිමත් කරන්න.
- සේවකයින් සියළුම ගනුදෙනුකරුවන්ගෙන් / වෙනත් කාර්ය මණ්ඩලයෙන් අවම වශයෙන් මීටර 1 ක දුරක් පවත්වා ගත යුතුය. අඩක් විවෘත කවුළුවක් හරහා ගනුදෙනුකරු සමඟ කතා කිරීමේදී ආරක්ෂිත දුරක් තබා ගැනීම මෙයට ඇතුළත් ය.
- අත්පොත පද්ධතියක් භාවිතා කරන්නේ නම්, සේවකයින් විසින් ගෙවන ලද කාලය, වාහන අංකය සහ මුදල සටහන් කිරීම සඳහා ලේඛනයක් / පොතක් පවත්වා ගත යුතු අතර ගෙවන ලද මුදල මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව පාරිභෝගිකයාට පෙන්විය යුතුය. සම්බන්ධතා අවම කිරීම සඳහා රිසිට්පත් අතින් භාර දීමට වඩා මෙම ක්‍රමය සුදුසු වේ.
- රථගාල තුළ වාහන ගෙනයාමට භාවිතා කිරීමට පාරිභෝගිකයින්ගෙන් වාහන යතුරු එකතු නොකරන්න. ඒ වෙනුවට පාරිභෝගිකයාගෙන් ඔවුන්ගේ ජංගම දුරකථන අංකය කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනය කරන ලෙස ඉල්ලා සිටින්න. අවශ්‍ය වූ විට පාරිභෝගිකයා නැවත කැඳවා වාහනය අවශ්‍ය ලෙස හසුරුවන්න.
- ගනුදෙනුකරුවන්ට වැලේ පාර්කින් සේවාව ලබා නොදෙන්න.
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන් සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම අයිතිකරු / භාරකරුගේ වගකීම වේ.

**පරිශීලකයා / සේවාදායකයා**

- පුද්ගලයන් අතර සම්බන්ධතා අවම කිරීම සහ මුදල් මාරු කිරීම සඳහා ස්වයංක්‍රීය / වාහන නැවැත්වීමේ ගෙවීම් / තමන් ප්‍රවේශ පත්‍ර යන්ත්‍ර තිබේ නම් ඒවා භාවිතා කරන්න. යන්ත්‍ර භාවිතයෙන් පසු ඔබේ දෑත් පිරිසිදු කරන්න.
- මුදල් පරිහරණය අවම කිරීම සඳහා නිශ්චිත වාහන නැවැත්වීමේ ගාස්තු ලබා දීම.
- වාහන නැවැත්වීමේ ගාස්තු කුවිතාන්සියක් ඔබ වෙත භාර දෙන්නේ නම්, එය ප්‍රවේශමෙන් බැහැර කර වෙනත් දෙයක් ස්පර්ශ කිරීමට පෙර වහාම ඔබේ දෑත් පිරිසිදු කරන්න. වාහන නැවැත්වීමේ ගාස්තු ලේඛනයක්

පවත්වා ගෙන යන්නේ නම්, ගෙවන ලද ගාස්තුව ලේඛනයේ ඇතුළත් කර ඇති බවට සහතික වන්න, කුවිතාන්සියක් ඉල්ලන්න එපා.

- කාර්ය මණ්ඩලය සමඟ කතා කිරීමේදී අවම වශයෙන් මීටර 1 ක පුද්ගල දුරස්ථභාවයක් පවත්වා ගෙන යන බවට සහතික වන්න. කවුළුවක් හරහා කතා කිරීමේදී ආරක්ෂිත දුරක් තබා ගැනීම මෙයට ඇතුළත් ය.
- අවශ්‍ය නම් වාහනය ගෙනයාමට ආරක්ෂක යතුරු සමඟ වාහන යතුරු තබන්න එපා. ඒ වෙනුවට, ඔබේ ජංගම දුරකථන අංකය කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනය කර ඔබේ වාහනය ගෙනයාමට අවශ්‍ය නම් ඔබ අමතන්නැයි ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.
- ඔබේ ආරක්ෂාව සඳහා රථය ඔබම ගාල් කරන්න.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- ඇතුල්වීමේ ගේට්ටුවේ පෝස්ටරය ප්‍රදර්ශනය කරන්න.
- සියලු සේවකයන්ට කෙටි උපදෙස් ලබා දෙන්න .




සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.